# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2018 අංක 26 දරන
# සුරාබදු (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2018 සැප්තැම්බර් මස 03 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2018 සැප්තැම්බර් මස 07 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකි ය.

**මිල :** රු. 8.00     **තැපැල් ගාස්තුව :** රු. 15.00

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**2018 අංක 26 දරන**
**සුරාබදු (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 2018 සැප්තැම්බර් මස 03 වන දින]

එල්. ඩී.— ඕ. 21/2018.

**(52 වන අධිකාරය වූ ) සුරාබදු ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 2018 අංක 26 දරන සුරාබදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (52 වන අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 30 වන වගන්තිය පහත දක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— (52 වන අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 30 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) (1) වන උපවගන්තියේ "බලපත්‍රයක් යටතේ බදු අයකළ හැකි ද්‍රව්‍යයක් නිෂ්පාදනය කරන හෝ විකුණන සෑම තැනැත්තකුම" යන වචන වෙනුවට "බලපත්‍රයක්, අවසර පත්‍රයක් හෝ පාස් පතක් යටතේ යම් බදු අයකළ හැකි ද්‍රව්‍යයක් ආනයනය කරන, අපනයනය කරන, ප්‍රවාහනය කරන, නිෂ්පාදනය කරන, විකුණන, සන්තකයේ දරන හෝ ගබඩාකර තබන සෑම තැනැත්තකුම" යන වචන ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ පැති සටහනේ "ඇතැම් බලපත්‍රලාභීන්"යන වචන වෙනුවට "බලපත්‍රයක්, අවසර පත්‍රයක් හෝ පාස් පතක් දරන්නා"යන වචන ආදේශ කිරීමෙන්.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තියේ (ඒ) ඡේදයට ඉක්බිතිව ම පහත දක්වෙන අලුත් ඡේද ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(ඒඅ) යම් බදු අයකළ හැකි ද්‍රව්‍යයක් ආනයනය කිරීමේ දී, අපනයනය කිරීමේ දී, ප්‍රවාහනය කිරීමේ දී, නිෂ්පාදනය කිරීමේ දී, විකිණීමේ දී, සන්තකය දරා සිටීමේ දී හෝ ගබඩා කිරීමේ දී එම බදු අයකළ හැකි ද්‍රව්‍යයක් මත ඇලවිය යුතු ආරක්ෂිත සලකුණුවල ස්වභාවය නියම කිරීම;

(ඒආ) යම් බදු අයකළ හැකි ද්‍රව්‍යයක් ආනයනය කිරීමේ දී, අපනයනය කිරීමේ දී, ප්‍රවාහනය කිරීමේ දී, නිෂ්පාදනය කිරීමේ දී, විකිණීමේ දී, සන්තකය දරා සිටීමේ දී හෝ

ගබඩා කිරීමේ දී එම බදු අයකළ හැකි ද්‍රව්‍ය මත ඇලවිය යුතු (ඒඅ) ඡේදයේ සඳහන් කරන ලද ආරක්ෂිත සලකුණු නිකුත් කිරීම සඳහා ගාස්තු අය කිරීම;".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**4.** මෙම පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි "ප්‍රකාශන පියස" හි දී මිල දී ගත හැකි ය.